# කුරුඳු ඔය ඇල්ල (මතුරට ඇල්ල)

අප සංචාරයේ අරමුණ: කුරුඳු ඔය දිය ඇල්ල නොහොත් මතුරට ඇල්ල නැරබීම, ඡායාරූප ගැනීම

දිනය : 2013 අගෝස්තු 09 සහභාගී වූවන් ගණන: 5

ගමන් කල ආකාරය: කොට්ටාවේ සිට කොළඹ දක්වා බස් රථයෙන්ද, කොළඹ කොටුවේ සිට උදැසන 5.55 සීඝ්‍රගාමී දුම්රියෙන් මහනුවර දක්වාද, මහනුවර සිට වලපනේ දක්වා මිතුරකුගේ කාර් රථයකින්ද, වලපනේ නගරයේ සිට මිතුරකුගේ ඩබල් කැබ් රථයකින් සහ පා ගමනින් දිය ඇල්ල දක්වා.

විශේෂ ස්තූතිය: හසන්ත (නවාතැන්, අහාර හා ප්‍රවාහන පහසුකම්), ලසිත රත්නායක (සිතියම් සැකසීම, ප්‍රවාහන පහසුකම්)

ඡායාරූප අනුග්‍රහය: නිශාන් කුළසිංහ, අරුණ සුගතපාල, ලසිත රත්නායක, මුදිත රුබසිංහ

මෙම වාර්තාව සැකසූයේ: නිශාන් කුළසිංහ විසිනි.

මෙම ස්ථානයට යන්නේ නම් ඔබෙන් කෙරෙන කාරුණික ඉල්ලීමයි! මෙම පරිසර පද්ධතිය ඔබ ඇතුළු සියලු ජීවී ප්‍රජාවගේත් උරුමයක් නිසා එය ආරක්ෂා කර ගත යුතු බවට නිරතුරු සිහි තබා ගන්න. ඔබ එහි ගෙන යන ප්ලාස්ටික් ඇතුළු සියලු අපද්‍රව්‍ය එම ප්‍රදේශයේ බැහැර නොකරන්න. ඔබ මත්පැන් පානය කර මෙම ප්‍රදේශ වල සංචාරය කිරීමෙන් වලකින්න. එය ඔබගේත් පරිසරයේත් එහි වෙසෙන ජීවී ප්‍රජාවගේත් යහපතට ඉවහල් වේ. ජලය හැර පරිසර පද්ධතියෙන් කිසිවක් ලබා නොගන්න. මේ පරිසර පද්ධතිය සියලු ජීවී ප්‍රජාවගේය. එම නිසාවෙන් එම පරසරය සුරකින්න. අපෙන් පසුවට එන ජීවී ප්‍රජාවටත් එය ආරක්ෂා කර තබන්න.

www.LakViskam.org

කුරුඳු ඔය ඇල්ල ශ්‍රී ලංකාවේ දිය ඇලි අතරින් උසින් දෙවන ස්ථානයට පත්වේ. මුහුදු මට්ටමේ සිට මීටර් 1,103m උසකින් පිහිටා ඇති එහි උස අඩි 676 (206m) ක් වේ. එය පිහිටා ඇත්තේ නුවරඑළියේ සිට 26km දුරින් එම දිස්ත්‍රික්කයේම වලපනේ නගරයට මදක් ආසන්නවය. මහවැලි පෝෂක ගංගාවක් වන කුරුඳු ඔයේ නිර්මාණයක් වන මෙම සුකොමළිය ඉතා ගැඹුරු ගිරි ප්‍රපාතයකින් කොටස් වශයෙන් පහලට ඇද හැලේ. මෙය දිය ඇල්ලක දුර්ලභ ගණයේ පිහිටීමකි. එනම් මෙම ඇල්ල දෙස වලපනේ දෙසින් ඈත සිට බලනවිට ඉහල කොටස පමණක් දැක ගත හැකි අතර ආසන්නයට ගොස් බලන විට ඉහල කොටස දර්ශණය නොවේ. ඊට හේතුව මෙම ඉහල කොටස, පහළ කොටසින් පැත්තකට වන්නට පිහිටා තිබීමයි. මෙම දිය ඇල්ල එතරම් ප්‍රකට නොමැති නිසා බොහෝ දෙනෙකු නරඹා නොමැත.







දුරට පෙනෙන දිය ඇල්ල

පිදුරුතලාගල කඳුපන්තියේ උතුරු බෑවුමෙන් උපත ලබා උතුරු දිශාවට ගලා බසින කුරුඳු ඔය, හයිෆොරස්ට් (high forest) ආසන්න කඳු වැටියෙන් ආරම්භ වී ගලා යන තවත් දිය පහරවල් වලින් පෝෂිතව තේ වතු, වගා බිම් මැදින් ගලාවිත් මතුරට ප්‍රදේශයේදී විශාල ගල් පර්වතයක් දිගේ කොටස් දෙකකින් යුක්තව ඇද හැලීමෙන් කුරුඳු ඔය දිය ඇල්ල නිර්මාණය වී ඇත. මේ හේතුව නිසා ඇතැම් අවස්ථාවලදී මෙය මතුරට ඇල්ල ලෙසද හඳුන්වා ඇත. කුරුඳු ඔය ආරම්භ වන්නේ ඉතා ශීතල දිය උල්පත් වලින් ඉතා පොහොසත් පෙදෙසකින් වන අතර කුරුඳුඔය ඇල්ල ගලාහැලෙන ප්‍රදේශය වලපනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් මධ්‍යම කඳුකරයේ ඇති ඉතා වියලි ස්වභාවයක් සහිත පෙදෙසකි. මෙම ජලකඳ රන්දෙනිගල ජලාශයද පෝෂණය කරනු ලබයි.




කුරුඳු ඔය අවට භූමියේ මුහුදු මට්ටමේ සිට උස දැක්වෙන සටහන

දිය ඇල්ලට ලගාවීම සඳහා මාර්ග කිහිපයක් පවතී. ඒවා කිසිවක් සතුටුදායක මට්ටමක නොපවතී. ඉහල කොටස හා පහල කොටස වශයෙන් වෙන්ව ඇති දිය අල්ලේ අසන්යටම ළගා විය හැකි මාර්ගයක් වනුයේ, නුවරඑළිය සිට රාගල දෙසට යන මාර්ගයේ බෲක්සයිඩ් හන්දියෙන් හැරී මහකුඩුගල, ගෝනපිටිය හරහා මතුරටට පැමිණ එහි සිට වාහනයක් ගමන් කලහැකි 4km ක් පමණ ගොස් ඉතිරි දුර අඩිපාරක් දිගේ ප්‍රපාතයකට පයින් ගමන් කිරීමයි. අවදානම් සහිත ගමනකින් පසු දිය ඇල්ලේ ඉහල කොටස ආසන්නයටම යාහැක. මහත් වූ ශබ්දයක් නගමින් ජලකඳ පහලට වැටෙන අයුරු ඔබට අත්දැකීමට හැකි වනු ඇත. පහළ කොටස නැරබීමට ආපසු හැරී පෙර අඩි පාරෙන් ගමන්කර පහලට බැසිය යුතුය.

වලපනේ සිට රාගල දෙසට දිවෙන මාර්ගයේ හරස්බැද්ද ප්‍රදේශයට පෙර දකුණුපස පිහිටි “මහ ඌව” වත්ත (Maha Uva Estate) නාමපුවරුව අසලින් හැරී දෙමළ විද්‍යාලයට යන පාර ඔස්සේ ගමන් කිරීමෙන්ද ඔබට දිය ඇල්ල සමීපයට යා හැක. මෙහිදී ඉහළ කොටස දුර සිටද පහල කොටස බොහෝ අසන්නයට

www.LakViskam.org

ගොස් නැරබීමට හැකියාව ඇත. වලපනේ සිට 7km දුරක් ඇති මෙය ඉතා දුෂ්කර මාර්ගයකි. මෙම මාර්ගය ගැමියන් සිය වගා-අස්වනු ප්‍රවාහනය කිරීමටත් කන්දේ ඉහළ පිහිටි සිය කෝවිල් වලට යාමටත් භාවිතා කරයි. මෙම මාර්ගය ඉතා පටු වන අතර එහි  තත්වය ඉතා අසතුටුදායකය. දිය ඇල්ලේ ඉහළ කොටස පෙනෙන මානයටම වාහනයකින් යා හැකි වුවත් එසේ යා හැක්කේ ජීප් රථ වැනි රළු භාවිතයට සුදුසු වාහන වලින් පමණි (Four Wheel Drive, Tractors).මීට අමතරව ත්‍රි රෝද රථද අල්ප ලෙස භාවිතාවනු දක්නට ලැබේ. ඔබට වාහන ගමන් කල හැකි අවසන් ස්ථානයේ සිට පහලට පයින් ගමන් කිරීමට සිදුවනු ඇත. එම ගමනේදී දිය ඇල්ලේ ඉහළ කොටස හොඳින් දර්ශනය වන අතර තවදුරටත් වංගු සහිත මාර්ගයේ ඉදිරියට යායුතුය. මෙම මාර්ගයේ සිට දිය ඇල්ලට සැලකියයුතු දුරක් තිබුනද වර්ෂාව හොඳින් ලැබෙන කාලයේදී දිය ඇල්ලෙන් නික්මෙන සිහින් ජල බිංදු සුළඟ සමග මෙම ප්‍රදේශයට හමා එන බව අපට දැනගැනීමට ලැබුණි. මෙම පයින් ගමන් කරන මාර්ගය මෑතකදී කුඩා පරිමාණ විදුලි බලාගාරයක ගල් විදින යන්ත්‍රයක් ගෙන යාම සඳහා තාවකාලිකව කපන ලද්දකි. අපගේ ගමන අතරවාරයේ මෙම ප්‍රදේශය දර්ශණය වන ආකාරයට කඳු අතර කේබල් කාර් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට සැලසුමක් ඇති බවටද දැන ගන්නට ලැබුණි.

මාර්ගය ඔස්සේ දිගටම යාමේදී ඔබට වන ලැහැබක් හමු වනු ඇත. එය පසුකල විට ගල් කඩා විනාශ කරන ලද විශාල ගල්තලාවක් ඇති පෙදෙසක් හමු වේ. එයද පසු කල විට ඔබට දිය ඇල්ලේ පහල කොටස හොඳින් දර්ශණය වනු ඇත.






www.LakViskam.org

වන ලැහැබ හා දිය ඇල්ල

කලින් සඳහන් කල පරිදි මෙම ප්‍රදේශයේ පුද්ගලික ජල විදුලි බලාගාරයක් ඉදිකිරීම පිණිස වනාන්තරය හා ගල්තලාව විශාල ලෙස විනාශ කර ඇති අයුරු දක්නට ලැබේ. එහි වැඩ කටයුතු නතර කර ඇති ස්වභාවයක් දිස්වුවද එය ස්ථිරවම නවතා දැමුවක් බව නොහැගේ. මෙම බලාගාරය ඉදි වුවහොත් මෙම ස්ථානයට පැමිණ දිය ඇල්ල නැරබීමට අනාගත පරපුරට නොහැකිවනු ඇත.

වැදගත් සටහන: මෙම දිය ඇල්ලෙන් ස්නානය කිරීමෙන් වලකින්න. ජීවිත කිහිපයක් මේ වන විට බිලිගෙන ඇති නිසා ඉතා අනතුරු දායක ස්ථානයකි.







විදුලි බලාගාරයක් ඉදි කිරීම සඳහා පරිසරය විනාශ කර තිබෙන අයුරු හා කඳු මුදුන් ගිනි තබා තිබෙන අයුරු

වලපනේ නගරයේ සිට ජපන් සාම චෛත්‍යය හරහා 5km පමණ දුරක් විහිදෙන තවත් දුෂ්කර මාර්ගයක් ඇත. මෙම මාර්ගය අතරමගදී ඉහත කී මාර්ගය සමග සම්බන්ධ වේ. මෙයද ජීප් රථ වැනි රථ වාහන වලට පමණක් සුදුසු මාර්ගයකි.

ඇල්ල අවට කඳු බොහොමයක් පාහේ කලකට ඉහත වන සතුන්ගෙන් ගහන වනාන්තර විය. නමුත් අද ඒවා එලි පෙහෙළි කර වගා කටයුතු සඳහා අල්ලාගෙන ඇත. සමහර කඳු ගිනි තැබීම නිසා වනාන්තර සම්පූර්ණයෙන් විනාශ වී අද වන විට මානා ආදී පඳුරු සහ පයිනස් ගස් වලින් වැසී ඇත. මෙවන් මිනිස් ක්‍රියාකාරකම් නිසා ඉතිරිව ඇති ජල උල්පත්ද සිදී ගොස් මේ ආකාරයේ දිය ඇලි අනාගත පරම්පරා වලට අහිමි වන දිනය නම් වැඩි ඈතක නොවේ.

www.LakViskam.org







අපේ කණ්ඩායම සහ අප ගමන් ගත් වාහනය

තවත් ජයාරූප එකතුවක් මෙතනින් නරබන්න

https://picasaweb.google.com/102500057347588371605/KuruduOyaFalls2013?noredirect=1#

මහ ඌව වත්තේ සිට දිය ඇල්ලට යන මාර්ගය පහලින් දැක් වේ.




මහ ඌව වත්තේ සිට දිය ඇල්ලට යන මාර්ගය

www.LakViskam.org

මෙම ලිපියේ අයිතිය “ලක් විස්කම්” වෙබ් අඩවිය සතුය. © www.lakviskam.org.

lakviskam@gmail.com